# 10 ශ්‍රේණිය

# බුද්ධ ධර්මය

## 07 පාඩම

**සැකසුම හා ඉදිරිපත් කිරීම**

**ඒ. වී. චමින්ද විජේකුමාර ආරියදාස මයා**

**කෑ/ දෙහි/ සීපෝත් සේනානායක ක. වි.**

**අධීක්ෂණය**

**බී.ඒ.අයි.අයි.සංජු ලෝචන මයා**

**සහකාර අධ්‍යාපන අධ්‍යක්ෂ (සිංහල හා ආගම)**

**දෙහිඕවිට අධ්‍යාපන කලාපය**

chamindavijeekumara@gmail.com

දු.ක. අංකය :- 0718416477, 0702035765

# 07 පාඩම

# මහලු වියෙහි දුක් නොවන්න තුරුණු දිවිය ගොඩනගන්න

## මෙම පාඩමෙහි හමුවන, අනුවණයින්ගේ ජීවිතවලට උපමා කළ සිදුවීම් දෙක

1. සිඳී ගිය පොකුණ දෙස බලා සුසුම් හෙළන මහලු කොස්වා ළිහිණියාගේ සිද්ධිය
2. මහවනයෙහි දිරා ගිය කොළ රොඩු අතර පතිත වූ ර්තලය පිළිබඳ සිද්ධිය

# 01. මහලු කොස්වා ළිහිණියාගේ සිද්ධිය ඇතුළත් ධම්ම පද ගාථාව හා අර්ථය

**ගාථාව**

අචරිත්වා බ්‍රහ්ම චරියං
අලද්ධා යොබ්බනේ ධනං
ජිණ්ණ කොඤ්චාව ඣායන්ති
ඛීන මච්ඡේච පල්ලලේ

ධම්ම පදය, ජරා වග්ගය,10 ගාථාව



**අර්ථය**

උතුම් ශීලා දී පිළිවෙත්හි ද නොයෙ දී තරුණ වියේ දී උපන් ධනය රැක ගැනීමෙන් හා නූපන් ධනය ඉපදවීමෙන් ද තොර ව ජීවත් වන්නෝ වැසි සමයෙහි මසුන් අල්ලා නොගෙන පසු ව සිඳී ගිය පොකුණ දෙස බලා පසුතැවිලි වන මහලු කොස්වා ළිහිණියන් මෙන් පසු තැවෙන්නෝ ය. සුසුම් ලන්නෝ ය

# 02. මහ වනයෙහි වැටී දිරාපත් වන ඊතලය පිළිබඳ සිද්ධිය ඇතුළත් ධම්මපද ගාථාව හා අර්ථය

**ගාථාව**

අචරිත්වා බ්‍රහ්මචරියං
අලද්ධා යොබ්බනේ ධනං
සෙන්ති චාපාතිඛීණාව
පුරාණානි අනුත්ථුනං

ධම්ම පදය, ජරා වග්ගය,11 ගාථාව



**අර්ථය**

උතුම් වූ ශීලාදී ගුණධර්මයන් සම්පූර්ණ කිරීම ද නොකොට තරුණයෙකු ලෙස තම හැකියාව යොදවා ධනය උපයා ගැනීමෙහි ද නිරත නොවී කෙළි දෙලෙන් ජීවත් වන්නෝ දුන්නෙන් විදින ලද ඊතලය වේගයෙන් ගොස් වනයේ වැටී දිරාපත් ව යන්නාක් මෙන් වැඩිහිටි වයසට පත් වූ විට පෙර කළ කී දෑ සිහි කරමින් සුසුම් ලති. ජීවිතයේ පලක් නොලබති

# ඉහත ධම්ම පද ගාථාවන්හි අදහස

1. උසස් ගුණ දහම් ද නොපුරා, ධනය ද උපයා නොගන්නා තරුණයාට සිදු වන්නේ පසු ව සසුතැවිලි වීමට ය
2. තමාගේ ම නුසුදුසු පැවතුම් ගැන සිතමින් දුක් විඳීමට ය

# ජීවිතය ජයගත් තරුණයෙකුට කළ දේශනාව ඇතුළත් ධම්ම පද ගාථාව හා අර්ථය

**ගාථාව**

උට්ඨානවතෝ සතිමතෝ
සුචිකම්මස්ස නිසම්මකාරිනෝ
සඤ්ඤතස්සච ධම්ම ජීවිනෝ
අප්පමත්තස්ස යසෝභි වඩ්ඪති

**අර්ථය**

උත්සහවන්ත වූ, මහා සිහිය ඇති, නිවැරදි දෙය පරීක්ෂාකාරීව කරන, හික්මීමෙන් යුත් දැහැමිව ජීවත් වන තැනැත්තාගේ යසස වැඩෙන්නේය

# ඉහත ගාථාවෙහි සඳහන් යසස් වර්ධනයට හේතුවන හැකියාවන් හා ගුණ ධර්ම 7කි.

## 1.උට්ඨානවතෝ

- උත්සහවන්ත බව, නොපසුබස්නා වීර්යය, කායශක්තිය හා චිත්ත ශක්තිය නොමදව යොදවා වැඩ කිරීම

ඉහත ගාථාවෙහි සඳහන් යසස් වර්ධනයට හේතුවන හැකියාවන් හා ගුණ ධර්ම 7කි.

## 2. සතිමතෝ

- එලඹ සිටි සිහිය, යහපත් කල්පනාව, සතිය, හරි වැරදි දැක කටයුතු කිරීම

# ඉහත ගාථාවෙහි සඳහන් යසස් වර්ධනයට හේතුවන හැකියාවන් හා ගුණ ධර්ම 7කි.

## 3. සුචිකම්ම

- පිරිසිදුව කටයුතු කිරීම, කයින් වචනයෙන් හා සිතින් නිදොස් දේ කිරීම

## ඉහත ගාථාවෙහි සඳහන් යසස් වර්ධනයට හේතුවන හැකියාවන් හා ගුණ ධර්ම 7කි.

### 4. නිසම්මකාරී

- නුවණින් පිරික්සා, සිතා විමසා කටයුතු කිරීම

## ඉහත ගාථාවෙහි සඳහන් යසස් වර්ධනයට හේතුවන හැකියාවන් හා ගුණ ධර්ම 7කි.

### 5. සඤ්ඤත

- දමනය වීම, සංයත බව, හික්මීම, ශීලයෙන් කය වචනය හික්ම වීම

## ඉහත ගාථාවෙහි සඳහන් යසස් වර්ධනයට හේතුවන හැකියාවන් හා ගුණ ධර්ම 7කි.

### 6. ධම්මජීවි

- දැහැමි ව ජීවත් වීම, සම්මා ආජීවය

## ඉහත ගාථාවෙහි සඳහන් යසස් වර්ධනයට හේතුවන හැකියාවන් හා ගුණ ධර්ම 7කි.

### 7. අප්පමත්ත

- අප්‍රමාදය, ප්‍රමාද නොවීම, ජීවිතයේ අභිවෘද්ධියට දියුණුවට හානිකර දේ නොකිරීම

# තෙරුවන් සරණයි...!